# 01 මාතෘභූමි වන්දනා

අපගේ මාතෘභූමිය ශ්‍රී ලංකාවයි. වන්දනීය වූ ඒ මාතෘභූමිය පිළිබඳ ව අපට ඇත්තේ මහත් අභිමානයකි. මාතෘභූමි, ජන්මභූමි, නිජභූමි, ජාතභූමි යන යෙදුම්වලින් කියැවෙන උත්තමාර්ථය වන්නේ මවුබිම හෙවත් උපන්බිමයි. මවත්, මවුබිමත් දෙව්ලොවටත් වඩා උසස් කොට පැරණියන් විසින් සලකන ලද බව පෙනේ.

ඉපැදුණු දේශය මුල් කොට ගෙන ඒ පිළිබඳ ව සිතෙහි පහළ වන අභිමාන පූර්වක ගෞරවාන්විත ඇල්ම දේශානුරාගයයි. දේශාභිමානය, දේශ භක්තිය, දේශ වාත්සල්‍යය යන යෙදුම්වලින් ප්‍රකාශ වන්නේ ද ඉහත කී අදහසට සමානුගත වූ හැඟීම් සමුදයකි. මෙසේ තම නිජබිම පිළිබඳ වූ මේ උත්තරීතර හැඟීමෙන් උද්දාමයට පත් කවීහු තම මාතෘභූමිය උත්කර්ෂවත් ලෙස වර්ණනාවට හසු කරමින් සියලු සුජාත දූ පුතුන්ගේ සිත් තුළ දේශාභිමානී හැඟීම් ජනිත කිරීමට සමත් ගීත රචනා කරති. මාතෘභූමියේ උත්තරීතර බව තේමා කොටගෙන ගැයෙන එම ගීත දේශාභිමානී ගීත ලෙස හැඳින්වේ.

ඔබ නිතර අසා ඇති එබඳු දේශාභිමානී ගීතවලින් දේශයේ රුව, ගුණ, ඔද, තෙද මහත් අභිමානයෙන් හා භක්තියෙන් වර්ණනාවට ලක් කර ඇති ආකාරය විමසා බලන්න. මවුබිමේ ස්වභාව සෞන්දර්යය, ස්වාභාවික සම්පත්, සශ්‍රීකත්වය, ඓතිහාසික ශ්‍රී විභූතිය, සංස්කෘතික උරුමය හා ජාතික නිදහස ගැන කියැවෙන මේ ගීත ඇසෙන විට සාඩම්බර හැඟීමක් ජනිත වෙයි. මෙලොවට බිහි වූ දිනයේ ඔබ මුලින් ම ආශ්වාස කළ ප්‍රාණ වායුව ඔබට ලබා දුන්නේ මවුබිමයි. ඒ ප්‍රාණ වායුව පමණක් නොව ඒ සමග මහරු දායාදයන් රැසක් ඔබට උරුම කර දී ඇත. මවුබිමේ සැබෑ උරුමක්කාරයෙකු ලෙස අභිමානයෙන් නැගී සිටින්නට අවශ්‍ය සියලු දේ ඔබට උපතින් ම හිමි වී ඇත. ජාතභූමිය තරම් අභිමානයෙන් හා ආත්ම ගෞරවයෙන් ජීවත් විය හැකි තැනක් මේ මිහිපිට තවත් නැත. මවුබිමේ දී ඔබ සුරක්ෂිත ය; අදීන ය; නිවහල් ය. මාතෘභූමිය, එහි සාරය උරාගෙන පෝෂණය වන ඔබට අවශ්‍ය උණුසුම, සිසිල, සැනසුම නොමඳ ව ගෙන දෙයි.

**"පෙරදිග ලෝකයේ මුතුඇටය"** යන විරුදාවලි ලත් සිරිලක් මව ස්වභාව සෞන්දර්යයෙන් ලොව අන් සියලු දිවයින් පරදවන්නී ය. දුටුවන් මන නුවන් බඳනා නීල කරදිය වළල්ලෙන් වට වූ මේ සුන්දර දිවයින වටා පිහිටි වෙරළ තීරය සිරිලක් මවගේ ගෙල බැඳි මුතුපටක් සේ චිත්තාකර්ෂණීය ය. ගංගා, ඇළ දොළ, කඳුවැටි, තැනිතලා, වනපෙත් ආදියෙන් සමලංකෘත වූ ජෛව විවිධත්වයට හේතු වූ අපා, දෙපා, සිවුපා

සත්ත්ව ප්‍රජාවට වාසභූමි වූ මේ දිවයින ස්වභාව සෞන්දර්යය ලැගුම් ගත් පාරාදීසයක් බඳු ය. සොබාදහමේ දයාද ලෙස උරුම වූ ස්වාභාවික සම්පත් හේතුවෙන් සශ්‍රීක ය. ධන ධාන්‍යයෙන්, ආහාරපානාදියෙන් සමෘද්ධිමත් ය.

මාතෘභූමියේ ඓතිහාසික වෘත්තාන්තය අප මනස ඔදවත්, තෙදවත්, බැතිමත්, බලවත් හැඟීම්වලින් පුරවා අභිමානය ජනිත කරන්නේ ය. ප්‍රතාපවත් නරපතියන්, අභීත සෙන්පතියන්, වීර වික්‍රමාන්විත රණවිරුවන් ජාතියේ, දේශයේ නිදහස හා උරුමය රැක ගැනීමට ජීවිත පරිත්‍යාගයෙන් කළ සටන්, ඉතිහාසයේ රන් අකුරින් ලියැවී ඇත. වැව් අමුණු, වෙහෙර විහාර, දාගැබ්, පෙති පිළිම, ලලිත කලා, සාහිත්‍යය ආදි සංස්කෘතික උරුමයෝ ජාතියේ ප්‍රෞඪත්වය හා අභිමානය ලොවට කියාපාන්නෝ ය.

මෙබඳු දේශාභිමානී හැඟීම්වලින් ඔද වැඩුණු කවීන්ගේ සිත්හි පහළ වූ අපූර්ව සංකල්පනා ගී පද ලෙස ලියැවී ඇත. සංගීතඥයෝ ඒවා මිහිරි ගීත බවට පරිවර්තනය කළහ. ගායක ගායිකාවෝ දේශභක්තිය පෙරටු කොට ගෙන එම ගීත ගැඹුරු වූ මධුර ස්වරයෙන් ගායනා කළහ. අපි එබඳු වූ දේශාභිමානී ගී අසා රස විඳිමු. අපරිමිත වූ දේශ වාත්සල්‍යයෙන් සිත පුරවා ගනිමු. අපි දැන් දේශාභිමානී ගීත කිහිපයක් පිළිබඳ ව විමසා බලමු.

**ලංකා ලංකා පෙම්බර ලංකා**
**පිනවමු ඔබ ලංකා**
**හොබවමු ඔබ ලංකා - දිවි දී**
**සුරකිමු ඔබ ලංකා**

**බලි තරු රාවණ ගැමුණු විජයබා**
**නිරිඳුන් ලද ලංකා**
**පුලතිසි දැම් සිරි රහල් කුමරතුඟු**
**පඬුවන් ලද ලංකා**
**විදුසක්විති මහ පැරකුම් කිවිසුරු**
**කිවියන් ලද ලංකා**
**ඔබ රැකුණොත් ලෝකුඹුව ද අපහට**
**සීත ගඟුලි ලංකා**

**ලංකා ලංකා පෙම්බර ලංකා ...........**

ඔබහට අතපොවනට උන් මුන්හට
ඉඩ නො තබමු ලංකා
අවහොත් මෙහි උන් ලුහුබඳවා
ගොළු මුහුද හෙවමු ලංකා
ගොඩ දිය අහසේ හැම තැන ඔබගේ
නම කියවමු ලංකා
අවසන ඔබට ම පොහොරට මේ කය
මෙහි මැ හොවමු ලංකා

ලංකා ලංකා පෙම්බර ලංකා ..........



අරීසෙන් අහුබුදු සූරීන්ගේ පද රචනයකට අනුව සුනිල් සාන්තයන් විසින් ගායනය කරන ලද ප්‍රකට දේශාභිමානී ගීතයකි මේ. ගීතයේ මුල් කොටසින් ගැයෙන්නේ ලක් ඉතිහාසයේ නම රැන්දූ නිරිඳුන්, පඬිඳුන් හා කිවිඳුන් ගැන ය. ඒ විරුවන් ගැන කියන කවියා ඒ සමඟ ම ලංකා මාතාව රැකුණොත් ලෝකුඹු නිරය වුව ද අපට සීත ගඟුලක් වන බව කියයි. ගීතයේ දෙවන කොටස දේශය ආරක්ෂා කර ගැනීම පිළිබඳ ප්‍රතිඥාවකි. **"ඔබහට අතපොවනට උන් මුන්හට ඉඩ නො තබමු" "ගොඩ දිය අහසේ හැම තැන ඔබගේ නම කියවමු"** ප්‍රතිඥාවක් පමණක් නොව අවසන් පැතුමක් ද වේ. **"ඔබට ම පොහොරට මේ කය මෙහි මැ හොවමු"** දේශයට කීර්තියක් ගෙන දෙමින් අවසානයේ මේ පොළොවට ම පොහොරක් වීම කවියාගේ ප්‍රාර්ථනයයි.

දසක කිහිපයකට පෙර පාසල්වල වැඩ හුරු වීමේ ගීතය ලෙස ගායනා කෙරුණු අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල මැතිඳුන් විසින් රචනා කරන ලද

**ලෝකෙන් උතුම් රට ලංකාවයි**
**ලංකාවයි සිරි ලංකාවයි**
**අප නිජභූමිය ලංකාවයි**
**ලංකාවයි සිරි ලංකාවයි**

යනුවෙන් ආරම්භ වන දේශාභිමානය දනවන මියුරු ගීතය තවමත් අපේ මතකයේ රැඳී ඇත. එසේ ම එහි එන

**"රට වට මුහුදයි සිපප එන සුළඟයි**
**නො කඩව ගලනා ගංගාවෝ"**

**"බැලු බැලු හැම තැන හරිත වර්ණයයි**
**මෙහි නො වැවෙන කිසිවක් නෑ නෑ"**

යන ගී පදවලින් රටේ ස්වාභාවික සම්පත්වල සශ්‍රීකත්වය ඉස්මතු කරමින් දේශානුරාගය දනවන මිහිරි ගීතයක් නිර්මාණය වී ඇත. එතුමා විසින් රචිත,

**"සැම දන මන දිනු සුජාත ධරණී**
**සෞභාග්‍ය නිධානය ලංකා**
**වොරැඳේ වොරැඳේ වොරැඳේවා**
**සෞභාග්‍ය නිධානය ලංකා"**

යන ගීතය ද දේශානුරාගය දනවන්නකි.

**රත්නදීප ජන්මභූමි**
**ලංකදීප විජයභූමි**
**මේ අපේ උදාර වූ**
**මාතෘභූමියයි.**

**ආදි සිංහලේ......ඒ....**
**වීර මීමුතුන් ලෙයින්**
**සාර වූ උදාර වූ**
**මාතෘභූමිය යි.**

මහගම සේකරයන්ගේ විශිෂ්ට ගී පද රචනාවකට අනුව පණ්ඩිත් අමරදේවයන් විසින් ගායනය කරනු ලබන මේ ගීතය දේශභක්තියෙන් අප සිත් පුබුදුවාලීමට සමත් වේ. ප්‍රබල සංකල්ප රූපාවලියක් යොදා ගනිමින් මාතෘභූමියේ උදාරත්වය පිළිබඳ ප්‍රෞඪ හැඟීමක් අප සිත්හි ජනිත කිරීමට කවියා සමත් වී ඇති අයුරු බලන්න.

**"වීර මී මුතුන් ලෙයින් සාර වූ උදාර වූ මාතෘභූමිය යි"**

මේ පොළොව සරුසාර වී ඇත්තේ අපගේ මී මුතුන්ගේ රුධිර ධාරාවලිනි. මහ පොළොවෙහි මැණික් ලෙස නිධාන ගත වී ඇත්තේ ද අභීත දූ පුතුන් ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ ජීවිතේ පුද හෙළූ ලේ කඳයි. දේශය හරහා හමා යන්නේ වීර මී මුතුන් හෙළූ ප්‍රාණ වායුව යි. තරංග රාව දී ගලන ගංගා ගායනා කරන්නේ වීරයන්ගේ යශෝ ගීතය යි.

දේශයේ ස්වභාව සෞන්දර්යය, ස්වාභාවික සම්පත්, සශ්‍රීකත්වය යන මේ සියල්ල වීර මී මුතුන්ගේ ලේ උරුමය සමග ගළපා මාතෘභූමියේ ශ්‍රී විභූතිය ප්‍රකාශ කිරීම මඟින් උක්ත ගීතය අසන අප සිත් දේශවාත්සල්‍යයෙන් උද්දාමයට පත් කරයි.

අප මාතෘභූමියේ මහා සංස්කෘතික උරුමය පිළිබඳ ව උදම් අනමින් එහි උදාර බව ප්‍රකාශ කරන දේශාභිමානී ගී ද බහුල ව අසන්නට ලැබෙයි.

**සසර වසන තුරු**
**නිවන් දකින තුරු**
**පින් කෙත හෙළ රන්දෙරණේ**
**යළි උපදින්නට - හේතු වාසනා වේවා**
**හේතු වාසනා**

**රත්නමාලි සෑ කිරණයි**
**මහබෝ සෙවණයි**
**තිසා වැවයි සීගිරියයි**
**මගේ උරුමයයි**



ඩෝල්ටන් අල්විස් කවියාගේ පද රචනයකට අනුව පණ්ඩිත් අමරදේවයන් විසින් ගායනා කරනු ලබන මේ ගීතයෙන් රුවන්මැලි සෑය, ශ්‍රී මහා බෝධිය, තිසා වැව හා සීගිරිය යන ජාතික උරුමයන් සිහි ගන්වමින් නිවන් දකින තුරු මේ පින්බිමේ යළි යළිත් ඉපදීමට හේතු වාසනා වේවා යි ප්‍රාර්ථනා කෙරේ. මෙම ගීත ශ්‍රවණය කරන අපි දේශවාත්සල්‍යයෙන් උද්දාමයට පත්වෙමු.

චිත්‍රානන්ද අබේසේකර කිවිඳුන් විසින් රචනා කරන ලද විශාරද දයාරත්න රණතුංගයන් විසින් ගායනා කරනු ලබන

**ජයසිරි මහ බෝධී - රන්මැලි සෑ ආදී**
**මිහින්තලය ඉසුරුමුණිය - අවුකන සිරිපා හිමේ**

යන ගීතයෙන් ද ඒ සංස්කෘතික දයාද ගැන සිහිපත් කෙරේ. එයින් ද මවුබිමට ආශීර්වාද කෙරෙන්නේ දේශාභිමානී හැඟීම් ජනිත කරවමිනි.

**මගේ රටට දළඳ හිමි සෙවණයි**
**මගේ රටට දළඳ හිමි සරණයි**
**සැපතින් සපිරුණු නිවහල් දෙරණයි**
**උපතින් මාහට මේ හැම උරුමයි**

සුනිල් සරත් පෙරේරා කිවිඳුන් විසින් රචනා කරන ලද සංගීත නිපුන් සනත් නන්දසිරි ගායකයාණන් විසින් ගයන ලද මේ ගීතයෙන් මුළු මහත් ජාතියට ම දළඳ සමිඳුන්ගේ සරණ ප්‍රාර්ථනා කෙරේ. අපගේ උතුම් පැතුම ද එය මැයි.


මේ සුන්දර මාතෘභූමියේ ශ්‍රේෂ්ඨත්වය අප හඳුනා ගත යුතු ය. අපට දෙපයින් සිට ගැනීමට පිහිටාධාර වන මේ ලක් දෙරණට අප ආදරය කළ යුතු ය. ජීවිත පරිත්‍යාගයෙන් එය ආරක්ෂා කර ගත යුතු ය. මවුබිමේ කීර්ති නාමය ලොව පුරා පැතිර වීමට දයක විය යුතු ය.

මේ උදර මාතෘභූමියේ යශෝ ගීතය චිරාත් කාලයක් සමස්ත ධරණීතලය පුරා රාව ප්‍රතිරාව නැංවීමට නම් අපේ ආදි මුතුන් මිත්තන් ගිය මඟ පරමාදර්ශ කොට ගෙන නූතන පරපුරේ අපගෙන් ද අරුත්බර මෙහෙවරක් මෙම පුණ්‍යභූමියට ඉෂ්ට විය යුතු ය. එම උදාර මෙහෙවර මතු උපදින ශ්‍රී ලාංකික සුදරකයන්ගේ දේශාභිමානී ගීතයකට නව අර්ථකථන සපයනවා ඇත.

**අරුත් පැහැදිලි කිරීම**

| | | |
|---|---|---|
| අපා | = | පාද නැති |
| අපරිමිත | = | සීමාවක් නැති, අප්‍රමාණ |
| අභිමානය | = | සාඩම්බර හැඟීම |
| උත්කර්ෂවත් ලෙස | = | ශ්‍රේෂ්ඨ ලෙස (මහ ඉහළින්) |
| ඕද | = | එඩිය |
| ගෞරවාන්විත | = | ගෞරවයෙන් යුක්ත |
| චිත්තාකර්ෂණීය | = | සිත් ඇදගන්නා |
| ජාතභූමිය | = | උපන් බිම |
| තෙද | = | තේජස |
| දිවි දී | = | ජීවිතය පුද |
| දේශානුරාගය | = | දේශය පිළිබඳ ඇල්ම |
| දේශවාත්සල්‍යය | = | දේශය පිළිබඳ ආදරය |
| නිජභූමි | = | උපන්බිම |
| ප්‍රෞඪත්වය | = | එඩිය සහිත බව |
| මාතෘභූමි | = | මවුබිම |
| වික්‍රමාන්විත | = | වික්‍රමයෙන් යුක්ත |
| සංකල්ප රූප | = | චිත්ත රූප, සිතෙහි ඇතිවන රූප |
| සමලංකෘත | = | මනාව අලංකාර කළ |
| හරිත වර්ණය | = | කොළ පැහැය |
| සුදරකයන් | = | යහපත් දරුවන් |

## ක්‍රියාකාරකම් 01



අවබෝධය

**පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) පාඩමෙහි ඇතුළත් ගීත ඛණ්ඩවලින් කියැවෙන සංස්කෘතික උරුමයන් විස්තර කරන්න.

(ii) මවුබිම පිළිබඳ අභිමානවත් හැඟීම් ජනිත වීමට හේතු වන කරුණු දක්වන්න.

(iii) ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා පාඩමෙහි යෙදී ඇති විවිධ වචන ලියා දක්වන්න.

(iv) "අවහොත් මෙහි උන් ලුහුබඳවා ගොළුමුහුද හෙවමු ලංකා" යන යෙදුමෙහි අරුත් පැහැදිලි කරන්න.

(v) ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් සමන්විත පාරාදීසයක් ලෙස හැඳින්වීමට හේතු වන කරුණු පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම් 02

**අක්ෂර වින්‍යාසය පිළිබඳ නිවැරදි ව්‍යවහාර ඔබ විසින් පහළ ශ්‍රේණිවල දී ඉගෙන ගෙන ඇත. මෙහි දැක්වෙන්නේ ශ, ෂ, ස අක්ෂර නිවැරදි ව යොදන ආකාරය පිළිබඳ රටා කිහිපයකි.**

(i) (අ) දුශ්චරිත, නිශ්චල, විනිශ්චය, ආශ්චර්යය, පශ්චාත්, පශ්චිම, තිරශ්චීන

(ආ) විශ්වය, ඊශ්වර, විශ්වවිද්‍යාලය, අශ්වයා, විශ්වාස, ආශ්වාස, ප්‍රශ්වාස

ඉහත 'අ' සහ 'ආ' කොටස්වල දක්වා ඇති පදවල තාලුජ ශ් යෙදී ඇත්තේ කවර අකුරකට මුලින් දැයි දක්වන්න. එවැනි තවත් පද සොයා ලියන්න.

(ii) ශිෂ්ට, ශිෂ්ටාචාර, ඉෂ්ට, විශිෂ්ට, අෂ්ටාංග, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, උෂ්ණ, කෘෂ්ණ, තෘෂ්ණාව

(අ) ඉහත දැක්වෙන පදවල මූර්ධජ 'ෂ්' යෙදී ඇත්තේ කවර අකුරුවලට පෙරටුව දැයි දක්වන්න. තවත් එවැනි පද සොයා ලියන්න.

(iii) මූර්ධජ 'ෂ' යෙදෙන තවත් රටා තුනක් පහත දැක්වේ. ඒ කවරේ දැයි හඳුනා ගන්න. තවත් එබඳු පද සොයා ලියන්න.

(අ) ලක්ෂණ, නිරීක්ෂ, ප්‍රත්‍යක්ෂ, දූරේක්ෂය, රක්ෂණ, අධ්‍යක්ෂ, පක්ෂ, රක්ෂා, අක්ෂි,

(ආ) උත්කර්ෂ, පර්ෂදය, වර්ෂා, වර්ෂ, ශීර්ෂ

(ඇ) නිෂ්පාදන, නිෂ්ක්‍රිය, නිෂ්ඵල, නිෂ්ප්‍රභ

(iv) දන්තජ ස් යෙදී ඇත්තේ කවර අකුරුවලට පෙරටුව දැයි සොයා ලියන්න.

අස්ථාන, ආස්තරණ, ආස්වාද, ප්‍රස්තාර, ප්‍රස්තාව, ප්‍රස්තාවනා, වස්තු, විස්මය, මස්තක

## ක්‍රියාකාරකම් 03

**ඔබ උගත් කරුණු ඇසුරින් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

(i) කණ්ඩායම් වශයෙන් සැදී '**දේශාභිමානී ගීත සරණිය**' නමින් වැඩසටහනක් ඉදිරිපත් කරන්න.

(ii) "**සුන්දර ශ්‍රී ලංකා**" තේමාව යටතේ සිතුවම් දැක්මක් ඉදිරිපත් කරන්න.

(iii) පන්තියේ සියලු දෙනා එක් ව "**මගේ මවුබිම**" තේමාව යටතේ බිත්ති පුවත්පතක් නිර්මාණය කරන්න.

(iv) පාසලේ මාධ්‍ය කවය මඟින් දේශාභිමානී ගී හඳුන්වා දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න.

(v) පාසලේ සාහිත්‍ය සංගමයේ දී තනි ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ දේශාභිමානී ගීත ගායනා කරන්න.

(vi) මෙහි දැක්වෙන ගීත රචකයන් හා ගායකයන් ඉදිරිපත් කර ඇති වෙනත් ගීත එකතු කරන්න.

## ක්‍රියාකාරකම් 04

(i) ජාතික වීර දිනය නිමිත්තෙන් පාසලේ රණවිරු උපහාර උළෙළක් සංවිධානය කරන්න.

(ii) කණ්ඩායම්වලට බෙදී ඔබ ප්‍රිය කරන දේශාභිමානී ගීතයක් අර්ථාන්විත රංගනයක් සමඟ ඉදිරිපත් කරන්න.